# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.04 පැය 2000 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/645/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## යතුරු පැදි සොරකමකට සම්බන්ධ සැකකරුවන් 04 ක් හා සැකකාරියක් අත්අඩංගුවට - නවගමුව පොලිස් ස්ථානය.

2025.04.03 වන දින නවගමුව පොලිස් වසමේ යකාල, දියකඩිත්ත හන්දිය අසලදී නවගමුව පොලිස් ස්ථානයේ නිලධාරින් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 40 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන අංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධයෙන් සිදු කළ විමශර්නයේදී මොහු නවගමුව, තලංගම හා කැලණිය පොලිස් ස්ථාන වෙත වාතර්ා වී තිබූ යතුරු පැදි සොරකම් කිරීමේ සිද්ධීන් 06 ක ප්‍රධාන සැකකරු බවට අනාවරණය වී ඇත. වැඩිදුර විමශර්නයේදී මෙම අපරාධවලට සම්බන්ධ සැකකාරියක් හා තවත් සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර, සොරාගන්නා ලද යතුරු පැදි 02 ක් හා යතුරු පැදි කිහිපයක කොටස් විමශර්න නිලධාරින් විසින් සොයාගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 19 ක් හා සැකකරුවන් අවුරුදු 42,50 හා 53 වයස්වල පසුවන අංගොඩ හා වැල්ලම්පිටිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සැකකාරිය ප්‍රධාන සැකකරුගේ බිරිඳ වන අතර මොවුන් දෙදෙනා එක්ව යතුරු පැදි සොරකම් කිරීම සිදු කර ඇති බවට අනාවරණය වී ඇති අතර අනෙක් සැකකරුවන් තිදෙනා සොරකම් කරන ලද යතුරු පැදි කොටස් වෙන් කිරීම, යතුරු පැදි කොටස් මුදලට අලෙවි කිරීම හා සොර බඩු ලඟ තබා ගැනීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරුවන් 2025.04.04 වන අද දින කඩුවෙල ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ප්‍රධාන සැකකරුට වැඩිදුර විමශර්න සඳහා දින 07 ක රැඳවුම් නියෝග ලබා ගෙන ඇත. සැකකාරිය හා අනෙක් සැකකරුවන් තිදෙනා රුපියල් ලක්ෂ 05 බැගින් වූ ශරීර ඇප මත මුදා හැර ඇත.

අත්අඩංගුවට ගත් යතුරු පැදි හා යතුරු පැදි කොටස් වල වීඩියෝ පට 02 ක් මේ සමඟ යොමු කරමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**